# පාලින්ද නුවර පුරාණ රජමහා විහාර භූමිය තුළ පිහිටා ඇති නටබුන් හා පුරාවස්තු පිළිබඳ අධ්‍යයනක්.

ඩී . එස් . ඒ මුණසිංහ*

පුරාණ කෝට්ටේ රාජධානියේ අභීත සෙනෙවියෙකු වූ වීදිය බණ්ඩාරයන් හා සබැඳි ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුතු ස්ථානයක් ලෙසින් පාලින්ද නුවර පුරාණ රජමහා විහාර භූමිය පෙන්වා දිය හැකිය. මාලිගාගොඩැල්ල නමින් ද හැඳින්වෙන මෙම භූමිය තුළ පිහිටා ඇති නටබුන් හා පුරාවස්තු පිළිබඳ අධ්‍යයනයක් සිදු කිරීම මෙම පර්යේෂණයේ අරමුණය. පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරකයක් ලෙසට ද නම් කර ඇති මෙම ස්ථානය බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ අගලවත්ත මැතිවරණ කොට්ඨාශයේ පාලින්ද නුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පුරාණ පස්යොදුන් කෝරලයේ පිහිටා ඇත.

වර්තමානයේ දී විහාරයක්ව පවත්නා මෙම භූමිය තුළ හා ඒ අවට ප්‍රදේශයේ නටබුන් රාශියක් විසිරි පවත්නා අතරම වර්තමාන විහාරය සතුව ද පුරාවස්තූන් රාශියක් පවතී. ලිඛිත මූලාශ්‍ර හා ජනප්‍රවාදයන්ට අනුව වීදිය බණ්ඩාරයන් කෝට්ටේ රාජධානියෙන් පලාවිත් නැගෙනහිර පස්යොදුන් කෝරලයේ පැලැන්ද නුවර කරවා එම ප්‍රදේශ පාලනය කරමින් පෘතුගීසින් හා යුද වැදුණු බව සඳහන් වෙයි. මෙම පර්යේෂණය සිදු කිරීමේදී පළමුව ප්‍රදේශයේ පවත්නා ජනප්‍රවාද පිළිබඳව ද අනතුරුව ලිඛිත මුලශ්‍ර හා පුරාවිද්‍යා වාර්තා පිළිබඳව විමර්ශනය කරන ලදී. අනතුරුව භූමිය මත ඇවිදිමින් තිරස් ගවේෂණයක් සිදු කරන ලදී.

1948 වර්ෂයේ දී පුරාවිද්‍යා ස්මාරකයක් ලෙස ගැසට් කර තිබුණ ද වර්තමානය වනවිට මෙම උරුමයන් විනාශයට පත් වෙමින් පවතින අතර මෙම ප්‍රදේශය විධිමත් ගවේෂණයකට ලක්කර අදාළ නටබුන් හඳුනා ගෙන පවත්නා පුරාවස්තු සංරක්ෂණය සිදුකර ආරක්ෂා කිරීමට පියවර ගත යුතුව පවතී.

ප්‍රමුඛ පද : පාලින්ද නුවර, ස්මාරක, පුරාවස්තු, උරුමයන්, මූලාශ්‍ර

* පුරාවිද්‍යා අධ්‍යයනාංශය. කැළණිය විශ්වවිද්‍යාලය anuzone92@gmail.com